**නාගොඩ ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

  පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව වෙත සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලද රු.462,240 ක් වටිනා ස්ථාවර වත්කම් සහ මිලදී ගත් රු.90,350 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ආ) | සභාවේ පාරවල් සඳහා සකස් කල නාම පුවරු 24 ක් සඳහා රු.199,200 ක් දරා තිබූ අතර එය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සභාවේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.12,121,842 ක් දරා තිබූ නමුත් එය ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට විශ්‍රාම වැටුප් දායක මුදල් සඳහා රු.88,884 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ අපහරණය හා වෙන්දේසි කරන ලද වටිනාකම රු.88,970 ක් වූ වත්කම් හා වටිනාකම හඳුනාගත නොහැකි අයිතම 37 ක් 2022 වර්ෂයේ ස්ථාවර වත්කම් තුළින් ඉවත් කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු කර්මාන්ත ණය හිමි රු.70,384 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (උ) | සමාලෝචිත වර්ෂය තුළ කපා හරින ලද බදු පොලී හා කඩ කාමර කුලී රු.3,045,728 ක් වූ නමුත් ගිණුම් ගත කර ඇති කපා හරින ලද වටිනාකම රු.1,972,093 ක් වූයෙන් ලැබිය යුතු ආදායම රු.1,073,635 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.2,104,389 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.135,482,676 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | උපලේඛන ඉදිරියේ දී සකස් කර ඉදිරිපත් කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 හා 24 වගන්ති | මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.3,220,655 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,944,200 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ------ ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ------ ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අක්කර බදු | 865,000 | 1,063,469 | 1,186,032 | 399,641 | 801,000 | 986,126 | 921,636 | 522,204 |
| කුලී | 4,476,000 | 1,813,560 | 6,633,804 | 617,641 | 4,325,000 | 5,810,673 | 3,122,615 | 5,437,885 |
| බලපත්‍ර ගාස්තු | 551,000 | 965,740 | 1,696,452 | - | 691,500 | 1,405,015 | 1,320,931 | 730,712 |
| වෙනත් ආදායම් | 1,710,000 | 780,242 | 1,191,152 | 14,801,129 | 1,066,500 | 1,070,037 | 983,141 | 15,212,039 |
| | 7,602,000 | 4,623,011 | 10,707,440 | 15,818,411 | 6,884,000 | 9,271,851 | 6,348,323 | 21,902,840 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම රැස් කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.21,902,840 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එය රු.15,818,411 ක් විය. | හිඟ ශේෂය අයකර ගැනීමට අධිකරණයේ නඩු පවරා ඇති බව ඉතිරි ශේෂයන් අයකර ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අක්කර 05 ක භූමිය එළිපෙහෙළි කර සංවර්ධනය කිරීම සඳහා රු.427,830 ක් ගෙවීම් කර තිබුණ ද, ඉන් අක්කර 02 ක තරම් ප්‍රමාණයක වගා කර ඉතිරි අක්කර 03 ක පමණ ප්‍රමාණයේ කිසිදු වගාවක් කර නොතිබුණි. | වගා නොකල ප්‍රදේශයන්හි ලදු කැළෑව යම් මට්ටමකින් නැවත හටගෙන ඇති බව. | භූමිය ඵලදායී ආර්ථික කටයුතු සඳහා භාවිතා කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණය අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් වාර්ෂිකව තම බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් පුවරු පිළිබඳව සමීක්ෂණය කර, අදාළ ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ ගාස්තු නියමිත පරිදි අයකළ යුතු වේ. |

## 3.3 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන සලසා තිබූ රු.15,443,193 ක් වටිනා ව්‍යාපෘති දෙකක් ආරම්භ කර, වැඩ නිම නොකර අතහැර දමා තිබුණි. | ඉතිරි වැඩ සඳහා අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් නොකිරීම මත ව්‍යාපෘති නතර වී තිබූ බව. | ව්‍යාපෘති කඩිනමින් අවසන් කළ යුතු වේ. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වලකුඹුර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා රු.12,121,841 ක් ගෙවීම් කර තිබුණ ද, ප්‍රගතිය 25% තරම් අඩු ප්‍රමාණයක් විය. ව්‍යාපෘතිය අවසන් නොකිරීම නිසා අඩක් නිමකර ඇති ගොඩනැගිල්ල පරිසරයට නිරාවරණය වී දිරාපත් වීමේ අවදානමක් පැවති අතර, ඉදිකිරීම් කටයුතු කර ඇති කොටස් අනාරක්ෂිතව පැවතුණි. | ගොඩනැගිල්ලේ ආරක්ෂාව තහවුරු කිරිමට වහලය ඉදිකිරීම අත්‍යවශ්‍ය වන බැවින් ප්‍රතිපාදන වෙන් කල විගස එම කටයුතු සිදු කරන බව. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු වේ. |